සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 7 - 2019

**නම : ............................................ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය කාලය : පැය 01 යි.**

වැදගත් :

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

## A කොටස

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(1) එදිනෙදා ජීවිතයේ දී අවශ්‍ය ලිපිලේඛන පහසුවෙන් නිර්මාණය කිරීම සඳහා ............................ මෘදුකාංගය යොදා ගනී.
(1) MS Paint (2) MS Word (3) MS Powerpoint (4) MS Excel

(2) මධ්‍ය සැකසුම් ඒකකය භාවිත කරමින් සිටින දත්ත, තාවකාලිකව රඳවා ගනු ලබන්නේ,
(1) පාලන ඒකකය (2) මව් පුවරුව
(3) මතක රෙජිස්තරය (4) ගණිතමය හා තාර්කික ඒකකය

(3) පරිගණක දෘඩාංග සඳහා උදාහරණයක් නොවන්නේ,
(1) මූසිකය (2) සංදර්ශකය
(3) යතුරු පුවරුව (4) මෙහෙයුම් පද්ධතිය

(4) ඇල්ගොරිතමයක ඇති උපදෙස් පියවරකට පසු පියවරක් ලෙස ක්‍රියාත්මක වීම.................................. ලෙස හැඳින්විය හැකිය.
(1) අනුක්‍රමය (2) තේරීම (3) වරණය (4) පුණර්කරණය

(5) ජංගම දුරකථනවල භාවිත වන මෙහෙයුම් පද්ධතියක් වන්නේ,
(1) වින්ඩෝස් (windows) (2) උබුන්ටු (Ubuntu)
(3) ෆෙඩෝරා (windows) (4) අයි ඕ එස් (iOS)

(6) වෙබ් පිටු ගණනාවක එකතුවකි.
(1) අන්තර්ජාලය (2) විද්‍යුත් තැපෑල
(3) වෙබ් අඩවිය (4) ලෝක විසිරි වියමන

(7) ලෝක විසිරි වියමනෙහි නිර්මාතෘ වන්නේ........................................................... මහතා ය.
(1) ටිම් බර්නස් ලී (2) චාල්ස් බැබේජ්
(3) ජෝශප් ජැකුවාඩ් (4) ජෝන් වොන් නියුමාන්

(8) මූලික යතුරු පුවරුවක ඇති අකුරු, ඉලක්කම්, විරාම ලකුණු සහ සංකේත ඇතුළත් කිරීම සඳහා ............................ යතුරු යොදා ගනී.
(1) කාර්ය (2) අනුලක්ෂණ (3) මෙහෙයුම් (4) සංචලන

(9) වෙබ් පිටුවෙහි පසුබිමට වර්ණයක් යෙදීම සඳහා <body> උසුලනය සමඟ ......................... උපලක්ෂණ භාවිත කරයි.
(1) src (2) img (3) bgcolor (4) background

(10) යතුරු ලියනය කිරීමේ දී කර්සරය එක් පේළියක් පහළට ගෙනයාමට භාවිත කරන යතුර වන්නේ,
(1) Alt (2) Ctrl (3) Tab (4) Enter

(2 x 10 = 20)

**I පහත සඳහන් වාක්‍ය හොඳින් කියවා බලා හරි නම් '' 4 '' ලකුණ ද, වැරදි නම් '' 5 '' ලකුණ ද වරහන් තුළ යොදන්න.**

(11) අනවරත ජව සැපයුම්( UPS ) භාවිතයෙන්, අධික ධාරාවක් මගින් පරිගණකයට වන හානි වලක්වා ගත හැකිය. (.........)

(12) ගොනු බහාලුමක්( folder ) තුළ, ගොනු( files) හා තවත් ගොනු බහාලුම් ( folders) තැන්පත් කළ හැකිය. (.........)

(13) පරිගණකයෙන් යම් කාර්යයක් සිදු කරන ඕනෑම අවස්ථාවක මධ්‍ය සැකසුම් ඒකකය පසුබිමින් ක්‍රියාත්මක වේ. (.........)

(14) බාහිර පුද්ගලයන්ට යවන ලද විද්‍යුත් ලිපි තැන්පත් වන්නේ Inbox තුළ ය. (.........)

(15) සමර්පණ මෘදුකාංග වල දී නව කදාවක් ඇතුළත් කිරීම සඳහා Home → New slide පියවර අනුගමනය කරයි. (.........)

(2 x 5 = 10)

**I ''අ'' කොටසට ගැළපෙන පිළිතුර ''ආ'' කොටසින් තෝරා යා කරන්න.**

| | අ | ආ |
|---|---|---|
| (16) | අප එදිනෙදා භාවිත කරන යතුරු පුවරුවයි. | Recycle bin |
| (17) | ප්‍රකාශ මාධ්‍ය ගබඩා උපක්‍රමයකි. | QWERTY |
| (18) | පරිගණකයේ මකා දමනු ලබන ගොනු මෙහි තැන්පත් වේ. | https |
| (19) | මෙමගින් විශ්වාසනීය වෙබ් අඩවියක් හඳුනාගත හැකිය. | Sprite |
| (20) | Scratch ක්‍රමලේඛ මෘදුකාංග අතුරු මුහුණතෙහි ප්‍රධාන කොටසකි. | DVD |

(2 x 5 = 10)

## B කොටස

I ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(01) (i) එක් එක් පරිගණක පරම්පරාවේ දී භාවිත කරන ලද ඉලෙක්ට්‍රොනික තාක්ෂණයන් පහත වගුවෙහි ලියන්න.

| පරිගණක පරම්පරාව | භාවිත කරන ලද ඉලෙක්ට්‍රොනික තාක්ෂණය |
|---|---|
| පළමු පරම්පරාව | a. |
| දෙවන පරම්පරාව | b. |
| තෙවන පරම්පරාව | c. |
| සිව්වන පරම්පරාව | d. |

(2 x 4 = 8)

(ii) මෙහෙයුම් පද්ධතියක කාර්යයන් දෙකක් ලියන්න.

1. ..............................................................................................................

2. ..............................................................................................................

(2 x 2 = 4)

(02) (i) පරිගණක දෘඩාංගවලට හානි සිදුවිය හැකි ආකාර 02ක් සඳහන් කරන්න.

1. ..............................................................................................................

2. ..............................................................................................................

(2 x 2 = 4)

(ii) දී ඇති ගොනුවෙහි (file) ගොනු නාමය සහ ගොනු දිගුව හිස්තැන මත ලියන්න.

ගොනු නාමය ..........................................................

ගොනු දිගුව ..........................................................




(2 x 2 = 4)


(iii) වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතයේ වාසි 02ක් ලියන්න.

1. ..............................................................................................................

2. ..............................................................................................................


(2 x 2 = 4)

(03) (i) සංඛ්‍යා දෙකක එකතුව සෙවීම සඳහා වන ගැලීම් සටහනක් පහත දක්වේ. එහි හිස්තැන්වලට සුදුසු පිළිතුරු ලියන්න.




(1.5 x 4 = 6)

(ii) මෙහි දැක්වෙන්නේ ඉහත ගැලීම් සටහනට අදාළව සංවර්ධනය කරන ලද Scratch වැඩසටහනයි. එහි නිවැරදි අනුපිළිවෙළ අනුව අංක යොදන්න. (උදාහරණයක් ලෙස පළමු පියවරක් දක්වා තිබේ.)




(1.5 x 4 = 6)

(04) (i) මෙහි දැක්වෙන්නේ වෙබ් පිටුවක කොටසකි. එයට අදාළ නිවැරදි html කේත දී ඇති ලැයිස්තුවෙන් තෝරා හිස්තැන මත ලියන්න.

li, h1, ol, /center, body

```
<.................>
     <center><.........>Subject</h1><...........................>
     <.................>
     <.................>ICT</li>
     <.................>Mathematics</li>
     <li>Science</li>
     </ol>
  </body>
```

**Subjects**

1. ICT
2. Mathematics
3. Science

(1 x 6 = 6)

(ii) පහත සඳහන් වෙබ් අතරික්සුවල නම් දී ඇති ලැයිස්තුවෙන් තෝරා හිස්තැන මත ලියන්න.

a. .......................... b. .......................... c. ..........................

(Opera, Internet Explorer, Firefox, Google Chrome, Safari) (2 x 3 = 6)

(05) (i) අන්තර්ජාලයෙන් සැලසෙන සේවා 3ක් ලියන්න.

1. ..............................................................................................................
2. ..............................................................................................................
3. ..............................................................................................................

(2 x 3 = 6)

(ii) අනිෂ්ට මෘදුකාංගවලින් ඔබේ පරිගණකයට සිදුවන හානි 3ක් ලියන්න.

1. ..............................................................................................................
2. ..............................................................................................................
3. ..............................................................................................................

(2 x 3 = 6)

**Anwer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 7 - 2019

### තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදය - පිළිතුරු පත්‍රය

### A - කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 06. | 3 | 11. | 5 | 16. | QWERTY |
| 02. | 3 | 07. | 1 | 12. | 4 | 17. | DVD |
| 03. | 4 | 08. | 2 | 13. | 4 | 18. | Recycle bin |
| 04. | 1 | 09. | 3 | 14. | 5 | 19. | https |
| 05. | 4 | 10. | 4 | 15. | 4 | 20. | Sprite |

(ලකුණු 2 x 20 = 40)

### B කොටස

01. (i) a. රික්තක නල b. ට්‍රාන්සිස්ටර් c. අනුකලිත පරිපථ d. ක්ෂුද්‍ර පරිපථ
(ii) පරිශීලක අතුරු මුහුණතක් සැපයීම
මධ්‍ය සැකසුම් ඒකකයේ කාර්ය පාලනය කිරීම (හෝ සුදුසු පිළිතුරක් සඳහා ලකුණු ලබා දෙන්න)
(2 x 4 = 8)


02. (i) අධික විදුලි ධාරාවක් ලැබීමෙන් පරිගණක පද්ධතිය ඇතුළත් අධික ලෙස රත් වීම.
දෘඪාංග මත දූවිලි තැන්පත්වීම (හෝ සුදුසු පිළිතුරක් සඳහා ලකුණු ලබා දෙන්න) (2 x 2 = 4)

(ii) ගොනු නාමය Paper.
ගොනු දිගුව docx (2 x 2 = 4)

(iii) ලේඛන නිර්මාණය
ලේඛන සංස්කරණය ලේඛන මුද්‍රණය (හෝ සුදුසු පිළිතුරක් සඳහා ලකුණු ලබා දෙන්න.
(2 x 2 = 4)

03. (i) a - දෙවන සංඛ්‍යාව ඇතුළත් කරන්න. b - සංඛ්‍යා දෙක එකතු කිරීම.
c - එකතුව පෙන්වීම d - නිමාව/ අවසානය

(ii)




(1 x 6 = 6)

04. (i)

```
<body>
    <center><h1>Subject</h1></center>
    <ol>
        <li>ICT</li>
        <li>Mathematics<li>
        <li>Science<li>

    </ol>
   </body>
```

(1 x 6 = 6)

(ii) a. Firefox b. Google Chrome c. Internet Explorer (2 x 3 = 6)

05. (i) විද්‍යුත් තැපෑල
වීඩියෝ සම්මන්ත්‍රණ
ගොනු හුවමාරුව
පින්තූර ආදිය බාගත කර ගැනීම. (2 x 3 = 6)

(ii) පරිගණකයේ වේගය අඩුවීම, දත්ත හා තොරතුරු මකා දැමීම, මෘදුකාංග ක්‍රියාවිරහිත කිරීම.
(2 x 3 = 6)